**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2024

මැයි - 2026

**BMGT E 3025 - කුඩා ව්‍යාපාර කළමනාකරණය**

කාලය : පැය තුනක් (03)

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08)

ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක 01**

 අ) ව්‍යාපාර සාර්ථකත්වය සඳහා වැදගත් වන මූලික ව්‍යවසායකත්ව ලක්ෂණ හතරක් ලැයිස්තුගත කරන්න.

(ලකුණු 04)

ආ) ව්‍යවසායක ක්‍රියාවලියේ අදියර විස්තර කරන්න. ව්‍යවසායකයෙකු අදහස් උත්පාදනයේ සිට වර්ධනය සහ තිරසාරභාවය දක්වා ගමන් කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) 21 වන සියවසේ ව්‍යවසායකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටළු සහ අභියෝග දෙකක් (02) ක් උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) කුඩා ව්‍යාපාරයක් සඳහා කළමනාකරණයේ වැදගත්කම් හතරක් (04) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 04)

ආ) ව්‍යාපාර ව්‍යාපෘතියක් තෝරා ගැනීමේ ක්‍රියාවලිය විස්තර කර සුදුසු උදාහරණ සමඟ එක් එක් පියවර විස්තර කරන්න.

(ලකුණු 08)

ඇ) ව්‍යාපාර ව්‍යාපෘතියක් තෝරා ගැනීමට බලපාන සාධක අදාළ උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) කුඩා ව්‍යාපාරයක් සඳහා මූල්‍ය සැලැස්මක වැදගත්කම් හතරක් (04) ලියන්න.

(ලකුණු 04)

ආ) ආරම්භක පිරිවැය, මූල්‍ය මූලාශ්‍ර, විකුණුම් පුරෝකථනයන්, මෙහෙයුම් වියදම් සහ මුදල් ප්‍රවාහ විශ්ලේෂණය ඇතුළුව නව ව්‍යාපාරයක් සඳහා මූල්‍ය සැලසුම්කරණයේ ප්‍රධාන අංග සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ඇ) කුඩා ව්‍යාපාර මුහුණ දෙන අභ්‍යන්තර හෝ බාහිර අවදානම් තුනක් හඳුනාගෙන මෙම අවදානම් අවම කිරීම සඳහා ව්‍යවසායකයින්ට භාවිතා කළ හැකි සුදුසු උපාය මාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

පහත සඳහන් ප්‍රකාශ සමඟ ඔබ එකඟ වන්නේද නැද්ද යන්න සඳහන් කර අදාළ පැහැදිලි කිරීම් සහ උදාහරණ සමඟ ඔබේ පිළිතුරු සාධාරණීකරණය කරන්න.

අ) තිරසාරභාවය සහ ආයතනික සමාජ වගකීම් (CSR) පිළිවෙත් කුඩා ව්‍යාපාරවලට අවශ්‍ය නොවන අතර, ඒවා විශාල සමාගම් සඳහා පමණක් වැදගත් වේ.

(ලකුණු 05)

ආ) ප්‍රතිචක්‍රීකරණය, බලශක්ති කාර්යක්ෂමතාව සහ තිරසාර මූලාශ්‍රකරණය වැනි පාරිසරික වගකීම් මුලපිරීම් කුඩා ව්‍යාපාර සඳහා පිරිවැය වැඩි කරන අතර දිගු කාලීන ප්‍රතිලාභ ලබා නොදේ.

(ලකුණු 05)

ඇ) කුඩා ව්‍යාපාරයක සාර්ථකත්වය සඳහා දිගු කාලීන වර්ධන උපාය මාර්ගවලට වඩා කෙටි කාලීන වර්ධන උපාය මාර්ග වැදගත් වේ.

(ලකුණු 05)

ඇ) උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ ගෝලීය ව්‍යාප්තිය කුඩා ව්‍යාපාර සඳහා අවදානම්වලට වඩා වැඩි අවස්ථා නිර්මාණය කරයි.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 05

අ) "කුඩා ව්‍යාපාරයක්" යනු කුමක්ද නිර්වචනය කර ඒවා වර්ගීකරණය කිරීමට භාවිතා වන ඕනෑම ප්‍රමාණාත්මක නිර්ණායක (03) තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ) වර්ධනය, නවෝත්පාදනය සහ හිමිකරුගේ අවසාන අරමුණු යන විවිධ ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරමින් "කුඩා ව්‍යාපාරයක්", "ව්‍යවසායකත්ව ව්‍යාපාරයක්" සමඟ සසඳන්න.

(ලකුණු 08)

ඇ) කුඩා ව්‍යාපාර බොහෝ විට විස්තර කරනු ලබන්නේ "විශාල ව්‍යාපාරවලට අනුපූරක" ලෙසය. මෙම සම්බන්ධතාවය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 06

අ) ඒක පුද්ගල ව්‍යාපාර සහ හවුල් ව්‍යාපාර සඳහා ඇති වාසි සහ අවාසි දෙක (02) බැගින් ලැයිස්තුගත කරන්න.

(ලකුණු 04)

ආ) "අසීමිත වගකීම" යන්න නිර්වචනය කර එය තනි පුද්ගල ව්‍යාපාර හිමියන්ට සැලකිය යුතු අවදානමක් ඇති කරන්නේ මන්දැයි පැහැදිලි කරන්න?

(ලකුණු 08)

ඇ) සාර්ථකත්වය සඳහා ව්‍යාපාරයේ නිවැරදි නෛතික ස්වරූපය තෝරා ගැනීමේ වැදගත්කම අගයන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 07

ආ) "ගෝලීයකරණය" නිර්වචනය කර එය ජාතික ආර්ථිකයකට ඇති කළ හැකි ධනාත්මක බලපෑම් දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 04)

ආ) ගෝලීයකරණ වෙළඳපොළක තරඟ කිරීමට උත්සාහ කරන විට කුඩා ව්‍යාපාර මුහුණ දෙන ඕනෑම බාධක හතරක් (04) සුදුසු උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ඇ) "ගෝලීයකරණය සංස්කෘතික සමජාතීයකරණය සහ ස්වෛරීභාවය පිළිබඳ ගැටළු හට ගැනීමට මග පාදයි." දේශීය කුඩා ව්‍යාපාර හිමිකරුවෙකුගේ දෘෂ්ටිකෝණයෙන් මෙම ප්‍රකාශය ඇගයීමට ලක් කර ඒවා ජය ගැනීම සඳහා යොදාගත හැකි උපාය මාර්ග අවධාරණය කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 08

අ) බුද්ධිමය දේපළ (IP) ආරක්ෂණ වර්ග දෙකක් (02) ලැයිස්තුගත කර ඒවා විශේෂයෙන් ආරක්ෂා කරන්නේ කුමක්දැයි සඳහන් කරන්න.

(ලකුණු 04)

ආ) "නීතිමය ආරක්ෂණ ක්‍රියාවලිය එක් වරක් පමණක් සිදුවන සිදුවීමක් නොව, අඛණ්ඩ අධීක්ෂණය සහ අලුත් කිරීමේ චක්‍රයකි". "නීතිමය ආරක්ෂණ ක්‍රියාවලිය" පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) නීතිමය සලකා බැලීම් සහ බුද්ධිමය දේපළ (IP) ආරක්ෂාව පිළිබඳ අවබෝධය "ඩිජිටල් යුගයේ" ව්‍යාපාරික තර්ජනවලට එරෙහිව උපායමාර්ගික පලිහක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේදැයි විවේචනාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**